සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 6 - 2019

නම : ............................................... ඉතිහාසය කාලය : පැය 02 යි.

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

## I කොටස

(01) ක්‍රි. ව. පස්වන සියවසේ දී මහාවංශය රචනා කරන ලද්දේ, මහාවිහාරවාසී භික්ෂූන් වහන්සේ නමක් වූ ................................ විසින් ය.

(පාහියන් හිමි, මහානාම හිමි, මහානාග හිමි)

(02) ලෝකයේ ප්‍රථම වරට බිහි වූ ජීවයක් සහිත බැක්ටීරියාව .................................. නමින් හැඳින්වී ය.

(නෙබියුලා, ඔපබීනියා, ප්‍රොකායෝට්)

(03) ප්‍රථම වරට රබර් බෝලයක් නිපදවූයේ .................................. ශිෂ්ටාචාර වැසියන් ය.

(මෙසපොතේමියානු, ඊජිප්තු, මායා)

(04) ශ්‍රී ලංකාවේ ප්‍රථම චෛත්‍ය වූ ථූපාරාමයට වටදාගෙයක් ඉදි කළේ .................................. රජතුමා විසිනි.

(දේවානම්පියතිස්ස, වසභ, මහසෙන්)

(05) 'කම්මාරදේව' නැමැති දෙවියන් වෙනුවෙන් පණ්ඩුකාභය රජතුමා විසින් .................................. සිදු කරන ලදී.

(පෙරහැරක් පැවැත්වීම, ගමක් තෑගි දීම, දේවාලයක් ඉදිකිරීම)

- අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති ප්‍රකාශ නිවැරදි නම් '3' ලකුණ ද වැරදි නම් 'X' ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.

(06) මානව පරිණාමයේ වැඩි කොටසක් සිදු වූයේ මහා හිම යුගය නම් වූ අධික ශීත කාලයේ ය. ( )

(07) කාලිබන්ගන් යනු ඊජිප්තු ශිෂ්ටාචාරයට අයත් ප්‍රධාන නගරයකි. ( )

(08) අප්‍රිකානු ප්‍රදේශවල ජීවත් වන මිනිසුන් 'නිග්‍රොයිඩ්' මානව වර්ගයට අයත් ය. ( )

(09) රුවන්වැලි මහා සෑයේ වැඩ නිම කළේ දුටුගැමුණු රජතුමා විසිනි. ( )

(10) කලා වැවේ සිට තිසා වැව දක්වා ජලය ගෙන යාමට ඉදි කර තිබෙන ඇළ මාර්ගය ''ජය ගඟ' යන නමින් ද හැඳින් වේ. ( )



For more past papers and exam resources,visit www.pastpaperszone.lk

। ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරුවලින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඉරක් අඳින්න.

(11) මිනිසා විසින් පළමු වරට ගින්දර භාවිතා කළ බවට සාධක හමු වී ඇත්තේ මින් කවර ස්ථානයකින් ද?

1. කැනඩාව
2. අප්‍රිකාව
3. ඊශ්‍රායලය
4. චීනය

(12) පුරාණ කාලයේ දාගැබක ආරක්ෂාව සඳහා ඉදි කරන ලද ගොඩනැගිල්ලක් හැඳින්වීමට යොදා ගත් නම වූයේ,

1. ආසනඝරය යි.
2. පඨමාඝරය යි.
3. වටදාගෙය යි.
4. ධාතු මන්දිරයයි.

(13) අනුරාධගාම, පුරයක් බවට පත් කරමින් අනුරාධපුර රාජධානිය බිහි කළ රජතුමා මින් කවරෙක් ද?

1. පණ්ඩුකාභය රජු
2. දේවානම්පියතිස්ස රජු
3. මුටසීව රජු
4. දුටුගැමුණු රජු

(14) සංඝමිත්තා තෙරණින් වහන්සේ ශ්‍රී ලංකාවට ජය ශ්‍රී මහා බෝ සමිඳු රැගෙන වැඩිය වරාය වන්නේ මින් කුමක් ද?

1. මහාතිත්ථ වරාය යි.
2. දඹකොළ පටුන වරාය යි.
3. ගෝකණ්ණ වරාය යි.
4. ලංකා පටුන වරාය යි.

(15) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරනු ලැබුයේ,

1. අභයගිරි විහාරයේ ය.
2. මහා විහාරයේ ය.
3. මාතලේ අලු විහාරයේ ය.
4. ජේතවන විහාරයේ ය.

। අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල හිස්තැනට අදාළ පිළිතුරු ලියන්න.

(16) ගොඩබිම පළමුවෙන් ම ශාක පැතිරී ගිය කාලය ......................................... යුගය නමින් හැඳින් වේ.

(17) ගිණිකොණ හා නැගෙනහිර ආසියානු රටවල ජීවත් වන්නේ ......................................... වර්ගයට අයත් හෝමෝසාපියන් වරු ය.

(18) ශ්‍රී ලංකාවට පැමිණි විජය ඇතුළු පිරිස ගොඩබසින ලද ස්ථානය ......................................... යන නමින් හැඳින්වේ.

(19) මහා වංශයේ සඳහන් වන පරිදි විජයගේ ඇමතිවරුන් විසින් ජනාවාස පිහිටවූයේ ......................................... ඔය ආශ්‍රිතව ය.


(20) ශ්‍රී ලංකාවේ භික්ෂු ශාසනයේ ආරම්භ වන්නේ ......................................... කුමරුගේ පැවිදි වීමත් සමග ය.

(ලකුණු 20 x 2 = 40)

# II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.
- වෙනත් කොළයක පිළිතුරු ලියන්න.

- පහත ලෝක සිතියම උදවු කරගෙන පිළිතුරු සපයන්න.




(01) (i) ඊජිප්තු ශිෂ්ටාචාරය හා ඉන්දු නිම්න ශිෂ්ටාචාරය පැතිරී ඇති මහද්වීප දැක්වෙන අක්ෂර 02 නම් කරන්න. (ලකුණු 2)

(ii) කොකොසොයිඩ් මානව වර්ගය පැතිරී ගිය මහාද්වීප 02ක් C හා D අක්ෂරවලින් දැක්වේ. එම මහාද්වීප 02 නම් කරන්න. (ලකුණු 2)



(iii) අද ජීවත් වන මානවයාට සම්බන්ධ තවත් දියුණු මානවයෙක් පින්තූරයේ දැක්වේ. මොහු කවු ද? (ලකුණු 1)

(iv) ඔහු කළ කාර්යය 03ක් නම් කරන්න. (ලකුණු 3)



(v) මෙම පින්තූරයේ දැක්වෙන්නේ කුමක් ද? මෙය භාවිතා කළේ කුමන ශිෂ්ටාචාරයේ ද? (ලකුණු 2)

(vi) මෙය භාවිතා කළේ කුමන කාර්යයක් සඳහා ද? (ලකුණු 2)



(vii) පින්තූරයේ දැක්වෙන දාගැබ කුමක් ද? (ලකුණු 2)

(viii) මෙම ස්තූපයේ ඉදි කිරීම අවසන් කළ රජු කවු ද? (ලකුණු 2)

(ලකුණු 2 x 8 = 16)

(02) (i) පහත වරහන් තුළ දී ඇති තොරතුරු ප්‍රයෝජනයට ගනිමින් පාසලේ ඉතිහාසය හැදෑරීමට වැදගත් වන මූලාශ්‍ර තුනක් ලියන්න. (ලකුණු 3)

(ජාතක කථා, ඡන්ද නාම ලේඛනය, ලොග් සටහන් පොත, වංස කථා, විදුහල්පති නාමාවලිය, සිසුන් ඇතුළත් වීමේ නාම ලේඛනය)

(ii) ක්‍රි. ව. හා බු. ව. පිළිබඳ ඔබගේ දැනුම භාවිතා කර පහත වගුව පුරවන්න.

| | ක්‍රි. ව. | බු. ව. |
|---|---|---|
| ඔබ උපන් වර්ෂය | ..................... | ..................... |
| වර්තමාන වර්ෂය | ..................... | ..................... |

(ලකුණු 4)

(iii) පහත වචන සටහන උදව්කරගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| නෙ | බි | යු | ලා | ව | ශා | ක |
| ඔ | ප්‍රෝ | කා | යෝ | ට් | ලා | වා |
| ප | පෙ | ලි | යෝ | සො | යි | ක |
| බි | සි | ලූ | රි | ය | න් | හා |
| නි | මැ | ම | ත් | අ | ලි | ශා |
| යා | තා | ක් | ෂ | ණ | ය | ව |
| හැ | ක | ර | ල් | ල | න් | ය |

(අ) පෘථිවිය නිර්මාණය වීමට හේතු කාරක වූවා යැයි සලකන දූවිලි වලාව හඳුන්වන නම

(ලකුණු 1)

(ආ) කැනඩාවෙන් හමු වී ඇති පාෂාණ භූත සලකුණ හඳුන්වන නම (ලකුණු 1)

(ඇ) මිනිසා සතු නොයෙක් නොයෙක් දේ තැනීමේ හැකියාව හඳුන්වන නම (ලකුණු 1)

(ඈ) පෘථිවිය උතුරු දකුණු ප්‍රදේශ හිමවලින් වැසී ගිය යුගයේ බිහි වූ සත්ත්ව වර්ගය (ලකුණු 1)

(03) (i) මිනිසා භාවිත කළ ගල් මෙවලම්වල ස්වරූපය අනුව ඔවුන්ගේ සංස්කෘතික දියුණුව බෙදෙන ප්‍රධාන අවධි 03 නම් කරන්න. (ලකුණු 3)

(ii) පහත සඳහන් වන්නේ විවිධ සංස්කෘතික අවධිවල ජීවත් වූ මිනිසුන් සතුව පැවති හැකියා කිහිපයකි. ඒවා අතරින් මධ්‍ය ශිලා යුගයේ පුද්ගලයා සතු හැකියා 04ක් තෝරන්න. (ලකුණු 4)

A - දුනු ඊතල භාවිත කර දඩයම් කිරීම ආරම්භ කිරීම.

B - ගල් මෙවලම් වෙනුවට ලෝහ ආයුධ සොයා ගැනීම.

C - එක තැනක ජීවත්වීමට හුරු වීම.

D - ආගමික කටයුතුවලට නැඹුරු වීම.

E - දැව දඬු කොළ අතු භාවිත කර නිවාස සෑදීම.

F - සතුන්ගේ ආරක්ෂාව පතා දෙවියන් ඇදහීම.

G - ගල් පර්වත බිත්ති මත චිත්‍ර ඇඳීම.

(iii) අප අද ආහාරයට ගන්නා ධාන්‍ය වර්ග කිහිපයක ආරම්භය සිදු වූ ආකාරය අනුව පහත වගුවේ හිස්තැන් පුරවන්න. (ලකුණු 4)


| රට | ධාන්‍ය වර්ගය | කාලය |
|---|---|---|
| 1. ...................... | බඩ ඉරිඟු | ක්‍රි. පූ. 3000 |
| මධ්‍යධරණී ප්‍රදේශ | 2. ...................... | 3. ...................... |
| චීනය | 4. ...................... | ක්‍රි. පූ. 7000 |

(04) (i) චීන ශිෂ්ටාචාරය විසින් ලෝකයට හඳුන්වා දුන් දේවල් 03ක් නම් කරන්න. (ලකුණු 3)

(ii) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ බිහි වූ නගර හොඳින් සැලසුම් කරන ලද ඒවා ය. එම ශිෂ්ටාචාරයට අයත් එලෙස සැලසුම් කරන ලද නගර 4ක් නම් කරන්න. (ලකුණු 4)

(iii) පහත දී ඇති තොරතුරු ප්‍රයෝජනයට ගනිමින් රූප සටහන සම්පූර්ණ කරන්න.

- * මම්කරණය ලොවට හඳුන්වා දීම.
- * ලෝකයේ පැරණිම වීර කතාව ලිවීම
- * අපද්‍රව්‍ය බැහැර කරන නළ පද්ධති ඉදි කිරීම.
- * චිත්‍රාක්ෂර භාවිත කිරීම.
- * තඹ ලෝහ ඊයම් භාවිත කිරීම.




(ලකුණු 4)

(05) (i) පහත සඳහන් ජනාවාස පිහිටුවා ගත් විජය කුමරුගේ ඇමතිවරු සඳහන් කරන්න. (ලකුණු 3)

1. අනුරාධගාම - ..........................................
2. උපතිස්සගාම - ..........................................
3. දීඝගාම - ..........................................

(ii) ඔබ ලංකා ඉතිහාසය ඉගෙනීමේ දී දැන ගත් ඓතිහාසික තොරතුරු කිහිපයක් පහත දැක්වේ. ඒවා අනුපිළිවෙළට සකස් කර ලියන්න.

A - අට සැට ලෙන් පූජා කිරීම.

B - රුවන්වැලි සෑය ඉදි කිරීම

C - ජය ශ්‍රී මහා බෝධිය වැඩම කිරීම.

D - ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම.

E - විජය කුමරු ලංකාවට පැමිණීම.

F - මින්නේරිය වැව ඉදි කිරීම.

G - එළාර රජු අනුරාධපුරය යටත් කිරීම.

H - අභය වැව ඉදි කිරීම. (ලකුණු 8)

(06) (i) එළාර රජු පරාජය කිරීමට ගිය ගමනේ දී දුටුගැමුණු කුමරුට උදවු කළ දක්ෂ බුද්ධිමත් සෙන්පතිවරු තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 3)

(ii) පහත සඳහන් ප්‍රකාශ හා සම්බන්ධ පිළිතුර සපයන්න.

A - වළගම්බා රාජ සමයේ ඇති වූ සාගතය හැඳින් වූ නම ..........................

B - දුටුගැමුණු රජතුමා අනුරාධපුරය බේරාගැනීමේ දී සහය වූ ඇතා ..........................

C - ශ්‍රී ලංකාව් මෙහෙණි සසුන ආරම්භ කිරීමට දායක වූ බිසව ..........................

D - සමස්ත ලෝකයේ ඉදි වූ විශාලතම ගඩොල් ස්තූපය ලෙස සැලකෙන්නේ ..........................

(ලකුණු 4)

(iii) ලංකා ඉතිහාසයේ විශිෂ්ට සේවාවක් කළ චරිතවල තිබූ උසස් ගුණාංග කිහිපයක් පහත දැක්වේ. එම ගුණාංගවලට සම්බන්ධ රජු ඉදිරියෙන් ලියා දක්වන්න. (ලකුණු 4)

A - බුද්ධිමත්ව කටයුතු කර ජයග්‍රහණය කිරීම හා ගරු කළ යුත්තන්ට ගරු කිරීම.

B - නොයෙක් බාධක හමුවේ ඉවසිලිවන්තව කටයුතු කිරීම.

C - ධෛර්‍යවන්තව දුර දක්නා නුවණින් හා විමසිලිමත් භාවයෙන් කටයුතු කිරීම.

D - තම රටවැසියා වෙනුවෙන් වෙහෙස වී වැඩ කිරීම.

(07) (i) පහත සඳහන් වැව් අතීතයේ හඳුන්වා ඇත්තේ කුමන නම්වලින් ද?

(A) නොච්චිපොතාන

(B) කනදරා වැව

(C) මහවිලච්චිය වැව (ලකුණු 3)


(ii) පහත සඳහන් ස්ථූපවල නිදන්කර ඇත්තේ කුමන පූජනීය වස්තූන් දැයි ලියා දක්වන්න.

(A) ථූපාරාමය

(B) රුවන්වැලි මහා ථූපය

(C) ජේතවන දාගැබ (ලකුණු 3)

(iii) පහත සඳහන් උපකාරක පද උදවු කරගෙන ප්‍රහේලිකාව පුරවන්න.




(ලකුණු 5)

**හරහට**

(1) වළගම්බා රජුට උදව් කළ හිමි නම

(2) මහසෙන් රජුගේ සොයුරාගේ නම

**පහළට**

(3) වසභ රජුගේ ඇමතිවරයෙකු වූ ඉසිගිරිය විසින් යාපනයේ ඉදි කළ විහාරය

(4) වසභ රජතුමා අයත් රාජ වංශය

(5) වසභ රජතුමා වැව්වල අලංකාරය සඳහා ඇති කළ සතුන් වර්ගය




For more past papers and exam resources,visit www.pastpaperszone.lk

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# තෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2019
# Third Term Test - Grade 6 - 2019

## ඉතිහාසය පිළිතුරු පත්‍රය

## I කොටස

(01) මහානාම හිමි
(02) ප්‍රොකායෝට්
(03) මායා
(04) වසභ
(05) දේවාලයක් ඉදිකිරීම.
(06) ✓
(07) x
(08) ✓
(09) x
(10) ✓
(11) ඊශ්‍රායලය
(12) වටදාගෙය
(13) පණ්ඩුකාභය
(14) දඹකොළ පටුන
(15) මාතලේ අලුවිහාරයේ ය.
(16) සිලුරියන් යුගය
(17) මොන්ගොලොයිඩ්
(18) තම්බපණ්ණී
(19) මල්වතු ඔය
(20) අරිට්ඨ කුමරු

(ලකුණු 20 x 2 = 40)

## II කොටස

(01) (i) A, B (ලකුණු 2)
(ii) උතුරු ඇමරිකාව හා ඕස්ට්‍රේලියාව (ලකුණු 2)
(iii) හෝමෝනියැන්ඩතාලෙන්සිස් (ලකුණු 1)
(iv) විශාල සතුන්ගේ ඇටකටු භාවිතා කර නිවාස සෑදීම.
එළවලු වර්ග පිස ආහාරයට ගැනීම.
ඔහු හොඳ දඩයක්කාරයකු වීම. (ලකුණු 3)
(v) මැටි පුවරුව (ලකුණු 2)
(vi) අකුරු ලිවීම සඳහා (ලකුණු 2)
(vii) මහා ථූපය (රුවන්වැලි සෑය) (ලකුණු 2)
(viii) සද්ධාතිස්ස (ලකුණු 2)
(ලකුණු 2 x 8 = 16)

(02) (i) ලොග් සටහන් පොත්, විදුහල්පති නාමාවලිය, සිසුන් ඇතුළත් වීමේ ලේඛන (ලකුණු 3)
(ii) ඔබ උපන් වර්ෂය අදාළ පරිදි සකස් කරන්න. - දරුවාගේ උපන් වර්ෂයට 544ක් එකතු කර සාදා දමන්න.
වර්තමාන 2019 - බු. ව. 2563 (ලකුණු 4)
(iii) (අ) නෙබියුලාව (ලකුණු 1)
(ආ) ඔපබීනියාව (ලකුණු 1)
(ඇ) තාක්ෂණය (ලකුණු 1)
(ඈ) මැමත් අලි (ලකුණු 1)

(03) (i) පුරා ශිලා යුගය, මධ්‍ය ශිලා යුගය, නව ශිලා යුගය (ලකුණු 3)

(ii) A, C, E, G (ලකුණු 4)

(iii) 1. මධ්‍යම මෙක්ෂිකෝව
2. තිරිඟු
3. ක්‍රි. පූ. 9000
4. වී (ලකුණු 4)

(04) (i) වෙඩි බෙහෙත්, මාලිමා යන්ත්‍රය, කඩදාසි, මුද්‍රණ යන්ත්‍රය මින් 3ක් දැක්වීම (ලකුණු 3)

(ii) මොහොන්ජදාරෝ, කාලිබන්ගන්, හරප්පා, ධොලවීර (ලකුණු 4)

(iii) ඉන්දු නිම්න - * අපද්‍රව්‍ය බැහැර කරන කාණු පද්ධති සෑදීම
* තඹ ලෝහය ඊයම් වැනි දෑ භාවිතා කිරීම.
නයිල් නිම්න - * මවීකරණය ලොවට හඳුන්වා දීම
* චිත්‍රාක්ෂර භාවිතය (ලකුණු 4)

(05) (i) අනුරාධ ඇමති, උපතිස්ස ඇමති, දීගායු ඇමති (ලකුණු 3)
(ii) E, H, C, A, G, B, D, F (ලකුණු 8)

(06) (i) දස මහා යෝධයන්ගෙන් තිදෙනෙක් නම් කර ඇත්නම් ලකුණු 3ක් දෙන්න. (ලකුණු 3)
(ii) A - බැමිණිතියා සාය
B - කඩොල් ඇතා
C - අනුලා දේවිය
D - ජේතවනාරාමය (ලකුණු 4)

(ii) A - දුටුගැමුණු රජතුමා
B - වසභ රජතුමා
C - මහසෙන් රජතුමා
D - ධාතුසේන රජතුමා (ලකුණු 4)

(07) (i) A - වාතමංගණ වැව
B - බානු වැව
C - මයෙන්ති වැව (ලකුණු 3)

(ii) ථූපාරාමය - දකුණු අකු ධාතුව
රුවන් වැලි මහා සෑය - බුදුහිමිගේ ශාරීරික ධාතු (ද්‍රෝනියක් ධාතු)
ජේතවන දාගැබ - පටී ධාතුව (බුදුහමිගේ බඳ පටිය) (ලකුණු 3)

(iii) **හරහට**
1. කුපික්කලතිස්ස
2. ජෙට්ඨ තිස්ස

**පහළට**
3. පියංගුකතිස්ස
4. ලම්බකර්ණ
5. හංසයින් (ලකුණු 5)

PASTPAPERSZONE.LK For more past papers and exam resources,visit www.pastpaperszone.lk